E-Journal of Social Work 2019 - 3 (1): 49-63

5

# THE MARITAL INSTITUTIONAL CHANGES SINCE PRE-COLONIAL ERA IN SRI LANKA

## ශ්‍රී ලංකාවේ පූර්ව යටත්විජිත සමයේ සිට විවාහ සංස්ථාවෙහි සිදු වූ විවිධ වෙනස්කම්

**A. H. I. Sanjeewa**
*BA(sp-Hons) (Sociology) University of Ruhuna.*
*Research Assistant, Social Development Policy, Research & Publications Division, National Institute of Social Development*

**Dr. Chamila Siriwardene**
*PhD (Philosophy & Psychology) University of Sri Jayawardenapura, MA (Political Science) University of Kelaniya, BA(sp-Hons) (Philosophy) University of Kelaniya.*
*Senior Lecturer, Department of Philosophy, Faculty of Social Sciences, University of Kelaniya*

**Abstract:** The traditional law interprets the marriage as a fundamental institution and it depends on the family system in the society. (Westermarck, 1926:26). When comparing with historical evidence in Sri Lankan context, it is no doubt that, traditional marriage has mutual relationship between family and kinship. Factors affecting marriage have become common, not only in traditional society but also in the present society. The argument in this article, reveal that the factors affecting the marriage are differed by the social structure. Accordingly, the actions of the entire social, economic, political and cultural corporations and sectors appear to have been affected. The traditional marital institutions were started by the form of cluster direction and it is in present direct individualization. So, therefore, the objectives, task and the trends in present marital intuition were generalized in this article. Comparing with literature, when analyzing various historical ethnographies, academic research and the articles as resources, the research finally conclude that, there is no more changes in present while comparing with traditional marriages in past but there are some modernizations in current family structure in the society.

**Key words: Marital institution, Traditional marriage, Pre-colonial era, New trends, Social structure**

**සංක්ෂේපයඃ** විවාහය මූලික සමාජ සංස්ථාවක් ලෙස සම්ප්‍රදායික නීතිය මගින් සලකනු ලබන්නේ විවාහය මත සමාජයේ මූලික අඩිතාලම වූ පවුල් ක්‍රමය රඳා පවතින බැවිනි (Westermarck,1926:26). ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික විවාහය ගත්විට එය පවුල හා ඥාතීත්වය අතර අන්‍යොන්‍ය සබඳතාවක් පවතින හෙයින් සමාජ සංස්ථාවක් ලෙස හඳුන්වාදීම සාවද්‍ය නොවේ යැයි සඳහන් කළ හැකිය. සම්ප්‍රදායික සමාජය තුළ පමණක් නොව වත්මන් සමාජ ක්‍රමයේද විවාහයට බලපාන්නා වූ සාධක පොදු ස්වභාවයක් ගෙන ඇත. වෙනස් වන්නේ ඒවායේ ස්වරූපය පමණක් බව මෙම ලිපියේ සාකච්ඡාවට බඳුන් වූ කරුණු තුළින් අනාවරණය කරගත හැකිය. පවත්නා වෙනස්කම් අධ්‍යයනය කිරීමේදී ඒවා සමාජ ව්‍යූහයේ සිදු වූ විපර්යාසයන් හේතුකොටගෙන ඇති වූ ඒවා බව ඒ තුළින් ධ්වනිත වේ. ඊට අනුව සමස්ත සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික සංස්ථාවන්ගේ හා අංශයන්ගේ ක්‍රියාකාරීත්වයන් බලපා ඇති බව පෙනී යයි. සම්ප්‍රදායික විවාහ සංස්ථාව සාමූහික දිශානතියකින් ආරම්භ වී වර්තමානය වන විට පුද්ගල දිශානතියක් කරා ගමන් කරන බව සම්ප්‍රදායික හා නූතන විවාහ සංස්ථාවේ පරමාර්ථ, කෘත්‍යයන් හා නව ප්‍රවනතා පිළිබඳ පහත සිදු කරන ලද අධ්‍යයනය තුළින් අනාවරණය කරයි. විවිධ ඓතිහාසික මූලාශ්‍ර, ශාස්ත්‍රීය පර්යේෂණ හා ලිපි විමර්ශනය කරමින් මෙම නිබන්ධය සකස් වී ඇති අතර එම සාහිත්‍ය මූලාශ්‍ර මගින් විශ්ලේෂිත කරුණු වත්මන් විවාහ සංස්ථාවට ගැලපීමේදී ශ්‍රී ලාංකේය විවාහ සංස්ථාව මුල් කාලීනව පැවති ස්වරූපයෙන් සම්පූර්ණ වශයෙන් වෙනස් වී නොමැති බවත්, යම් යම් නව ගුණාංගයන් එකතු වී ඇති බවත් පෙනී යයි.

**ප්‍රමුඛ පදඃ විවාහ සංස්ථාව, සම්ප්‍රදායික විවාහය, පූර්ව යටත්විජිත සමය, නව ප්‍රවනතා, සමාජ ව්‍යූහය**

**හැඳින්වීම**

වේද සාහිත්‍යයට අනුව පුද්ගල ජීවිතයේ පරමාර්ථ හතරකි. එනම් ධර්ම සම්පත්තිය, අර්ථ සම්පත්තිය, කාම සම්පත්තිය හා මෝක්ෂ සම්පත්තිය යි (උදිත හිමි,1989:143). මනුෂ්‍යයෙකුගේ ජීවිතය සාර්ථකත්වයට පත්වන්නේ විවාහයෙන් යැයි සමාජීය වශයෙන් පිළිගත් කරුණකි, එසේම විශ්වාසයකි. ඍග් වේදයට අනුව විවාහයෙහි පරමාර්ථ දෙකකි. එනම් දෙවියන් සඳහා යාග කිරීම හා ප්‍රජාව සඳහා පුතුන් ඇති කිරීමයි (ඍග් වේදය, x මණ්ඩලය: 36). උක්ත වේද ඉගැන්වීම් මඟින් ස්ඵුට වන්නේ පුද්ගලයා, සමාජය හා ආගම අතර ගොඩනැගෙන සබඳතාවය තුළ විවාහය වැදගත් වන බවයි. සාර්ථක ජීවිතයකට විවාහය අත්‍යවශ්‍ය නම් කාන්තාව යනු ජීවිතයක අර්ධයකි. පුරුෂයෙක් කාන්තාවක් ආවාහ කරගන්නා තුරු සම්පූර්ණ අයෙකු නොවේ (උදිත හිමි,1989:143). එනයින් බලන කළ අවිවාහකයා සමාජයට වැඩදායක අයෙකු ලෙස නොසැලකෙන බවක් පෙනී යයි. එබැවින් භාර්යාවක් සරණ පාවාගැනීම ප්‍රජා සංවර්ධනයට ද හේතු වන්නේ යැයි මනු නීතියේ සඳහන් වේ (ඍග් වේදය, x මණ්ඩලය:28). ඒ අනුව විවාහය සමාජ කෘත්‍යයක් සිදු කරන හෙයින් එය සමාජ පැවැත්මට නැතහොත් ප්‍රගමනයට හේතුකාරකයක් ද වන බව පෙනී යයි. එමඟින් පෙන්වාදිය හැකිවන්නේ කාලීනව සමාජීය වශයෙන් සිදු වන වෙනස්වීම් හි දී විවාහ සංස්ථාව ද විවිධ විපර්යාසයන්ට බඳුන් වන බවයි. එය සාධනීය ද? නැතහොත් නිශේධනීය ද? යන්න පවත්නා සමාජ ක්‍රමයේ සංස්කෘතියට අනුරූපව හඳුනාගත හැකි වේ. ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ විවාහය හා සංස්කෘතිය අතර පවත්නා සබැඳියාව මඟින් එය තවදුරටත් ප්‍රකට කරවයි. එමෙන් ම කුලය, ධනය, බලය, රූපය, නෑ පිරිස සහ පරම්පරාව ආදී සංස්කෘතික හා සංස්කෘතික නොවන සාධක ද විවාහයෙහි ගතිකත්වය කෙරෙහි බලපානු ලබන සාධකයෝ වෙති.

කාලානුරූපීව විවිධ සමාජ ව්‍යාපාර, විප්ලව ආදියේ බලපෑමත් සමඟ සිදුවන්නා වූ ව්‍යවස්ථාමය වෙනස්වීම් ද රාජ්‍ය තන්ත්‍රයේ සිදුවන වෙනස්වීම්ද සමාජ ආයතනයන්ගේ යම් යම් වෙනස්වීම් කෙරෙහි බලපෑමක් කරනු ලබයි. එය විවාහ සංස්ථාවටද පොදු කරුණක් ලෙස පෙන්වා දිය හැකිය.

විවිධ සමාජවල විවිධ වර්ගයේ විවාහයන් වෙනස් ආකාරයේ ස්වරූපයන්ගෙන් පවතී. එහෙයින්ම විවාහය සංකීර්ණ කරුණකි. එහි සංකීර්ණභාවය සහතික වන්නේ විවාහයන් සිදුකිරීමෙහි බොහෝ ගුණාංග වෙනස් විය හැකි නිසාවෙනි. එහෙත් වෙනස්කම් තිබියදී පවා විවාහය සංස්කෘතික වශයෙන් වැදගත් මෙන්ම සමාජයේ නොනැසී පවත්නා දෙයක් ලෙස තේරුම්ගත හැකිය. "විවාහය වර්ගීකරණය කරගැනීම සඳහා පදනමක් වශයෙන් විවාහයේ ගුණාංග වෙනස් වී ඇති ආකාරය කරුණු කිහිපයක් යටතේ හඳුනාගත හැකිය". එනම් **කලත්‍රයින්/සහකරුවන් සංඛ්‍යාව** (Number of Mates) *(ඒක විවාහ (Monogamy), බහු විවාහ (Polygamy))*, **අධිකාරී බලය** (Degree of Authority) *(සමානාත්මතාවය (Equalitarian), පීතෘ මූලික (Patriarchal), මාතෘ මූලික (Matriarchal))*, **විවාහයෙන් පසු පදිංචිය** (Residence after Marriage) *(පීතෘ වාසික (Patrilocal), මාතෘ වාසික (Matrilocal), නව්‍ය වාසික (Neolocal))*, **කලත්‍රයන්/සහකරුවන් තෝරාගැනීම** (Choice of Mates) *(නිදහස් තෝරාගැනීම (Free selection by young people), විවාහය ඉල්ලා සිටීම; දෙමාපියන් විසින් පාලනය කරන ලද තෝරාගැනීම (with courtship; controlled selection by parents)*, **තෝරාගැනීමේ පදනම** (Bases of Choice) *(ඥාතීත්වය (Kinship), කුලය (Caste), පන්තිය (Class), ප්‍රදේශය (Region), ආගම (Religion))*, **විවාහයේදී හුවමාරු වන දෑ** (Exchange at Marriage) *(මනාලිය සතු වත්කම් (Bride Wealth), මනාලයා වෙනුවෙන් මනාලියගේ පාර්ශ්වයෙන් කරනු ලබන ගෙවීම (Groom Price), සමාන වත්කම් හුවමාරුව (Equal Exchange))* **විවාහ වන වයස** (Age at Marriage) *(මුල් හෝ ළමා විවාහ (Early or Child Marriage), විවාහ වන වයස ප්‍රමාද වී සිදු කරන විවාහ (Late Marriage))*, **විවාහ බැඳීමේ ශක්තිමත්බව** (Strength of the Bond) *(තාවකාලික (Temporary), ලිහිල් දික්කසාද (Loose with Easy Divorce), දික්කසාද වීමට අපහසු/නොබිඳිය හැකි (Unbreakable with no Divorce))*, **නැවත විවාහවීමේ හැකියාව** (Possibility of Remarriage) *(විවාහ*

*නොවීම, අවසර ලැබීමෙන් නැවත විවාහවීම (Permissive Remarriage), අනිවාර්යයෙන් නැවත විවාහවීම (Mandatory Remarriage)),* **සහකරුවන්ගේ ස්වභාවය** (Kind of Mates) (විවාහය සහ උපභාර්යත්ත්වය/අනියම් භාර්යා සේවනය *(Concubinage)*) (Davis, 1948:120). යනාදිය යි. කිංග්ස්ලි ඩේවිස් යුරෝපීය සමාජ සන්දර්භය ආශ්‍රයෙන් පෙන්වා දුන් මෙම ගුණාංගයන් නූතනත්වය තුළ වෙනස් වී ඇති ආකාරයක් පෙනී යයි. විශේෂයෙන්ම සහකරුවන්/කලත්‍රයන් සංඛ්‍යාව තීරණය වීම යන සාධකයේදී ඒක විවාහ ක්‍රමය පෞරාණික වටිනාකම් (Inheritance) සහිත පද්ධතියක් ලෙස සියලු සමාජ විසින් වර්තමානය වන විට පිළිගත්තද එය සමාජය විසින් පනවන ලද්දක් (Socialy Imposed) බැවින් එහි ආතතිමය තත්ත්වයක් පවතින ප්‍රකාශ වේ (Fortunato, 2015:611). ඒක විවාහ ක්‍රමය හැරුණු විට සමලිංගික විවාහ ද නූතනය තුළ ජනප්‍රිය වෙමින් පවතින බව හඳුනාගත හැකිය. මේ වන විට යුරෝපීය සමාජය තුළ මෙන්ම ආසියානු සමාජය තුළ ද ඒ පිළිබඳ කතිකාවක් ගොඩනැගී ඇති බව පෙනී යයි. විශේෂයෙන්ම මෙහි ආරම්භය පිළිබඳ සාකච්ඡා කිරීමේදී මධ්‍යතන යුරෝපීය සමාජය තුළ රෝමානු කතෝලික පල්ලිය විසින් සමාන ලිංගික විවාහ (Same-Sex Marriage) පිළිගත් බවත් එය 20වන සියවස තුළදී බටහිර යුරෝපීය හා ඇමෙරිකානු සමාජය තුළ සමලිංගික විවාහ ලෙස ඉතා ජනප්‍රිය වූ බවත් ජෝන් බොස්වෙල් (John Boswell-1947-94) සඳහන් කරයි (Boswell in www.britannica.com).

**විවාහය නිර්වචනය කිරීම**

විවාහ සංස්ථාව යනු කිසියම් සමාජ පද්ධතියක් තුළ සියලු විවාහයන් සඳහා ගැලපිය හැකි සංකීර්ණ ප්‍රතිමානක රටාවකි (Normative Pattern). එමෙන්ම එය සදාචාරමය වශයෙන් වලංගු සහ බන්ධනීය යැයි සලකනු ලැබේ (Johnson, 2006: 178). එසේ වන්නේ උපත සහ මරණය අතර පුද්ගලයෙකුගේ ජීවිතයේ වැදගත්ම සිදුවීම ලෙස විවාහය සලකනු ලබන බැවින් හා වැඩිහිටි බවට පත්වීම සලකුණු කෙරෙන්නේ ද එමගින් වන නිසාවෙනි.

සමාජවිද්‍යා පිළිබඳ සංක්ෂිප්ත ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයට අනුව (The Concise Oxford Dictionary of Sociology, 1994) විවාහය යනු යම්කිසි අයිතිවාසිකම් සහ වගකීම් ඉටු කරන වැඩිහිටි පිරිමි සහ ගැහැණු අතර සිදුවන නීත්‍යානුකූලව පිළිගත් සම්බන්ධතාවයයි (Marshall & Barthel, 1994). ඇන්තනි ගිඩින්ස් (Anthony Giddens, 2002) සඳහන් කරන්නේ විවාහය, සමාජීයව පිළිගත් සම්බන්ධතාවක් සහ යම්කිසි අයිතිවාසිකම් සහ වගකීම් ඉටු කරන වැඩිහිටි පිරිමි සහ ගැහැණු අතර සිදුවන පිළිගත් ලිංගික සම්බන්ධතා සහිත ඒකකයක් ලෙස අර්ථ ගැන්විය හැකි බවයි.

විවාහය මිනිස් සමාජයේ පදනම වේ. සමාජයේ සැකැස්ම හැඩගස්වනු ලබන්නේ ද විවාහය මගිනි. විශේෂයෙන්ම ස්ත්‍රියක් හා පුරුෂයෙක් හට ජීවවිද්‍යාත්මක, මනෝවිද්‍යාත්මක, සමාජීය, ආචාරධාර්මික හා අධ්‍යාත්මික මට්ටමේදී පෞරුෂ සංවර්ධනය, ආදරය, විරුද්ධ ලිංගිකයන් මුණගැසීම ආදී විවිධ අවශ්‍යතා ඉටු කරගත හැකි විවාහය හැර වෙනත් ආයතනයක් නොහොත් සංස්ථාවක් මානව සමාජයේ හඳුනාගත නොහැක.

සමාජීය වශයෙන් මෙන්ම පුද්ගල ජීවිතයේ පරිපූර්ණත්වය සඳහා ද මිනිසෙක් හා කාන්තාවක් අතර ශාරීරික (Physical), නීතිමය (Legal) හා සදාචාරමය (Moral) වශයෙන් ඇති කරගනු ලබන සම්බන්ධතාවය විවාහය ලෙස විස්තර කළ හැකිය. එසේම සමාජ සැකැස්ම නොනවත්වා ඉදිරියට යාම සහතික කිරීම පිණිස දරුවන් බිහි කිරීම, ඔවුන් පෝෂණය කිරීම හා ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය සඳහා යොමු කිරීම විවාහ සංස්ථාව මගින් සිදු වන හෙයින් විවාහය යන්න පාරිශුද්ධ බන්ධනයක් (Sacred Union) ලෙස ද හඳුන්වා දිය හැකිය (Karunanayake, 2000: 13). මනුෂ්‍යයාට ඔවුන්ගේ චිත්තවේගීය (Emotional), සංස්කෘතිකමය (Cultural) හා ආර්ථිකමය (Economic) අවශ්‍යතා සංතෘප්ත කරගැනීම සඳහා ද විවාහ සංස්ථාව උපකාරී වේ. එය 'පවුල' නම් පළමු මිනිස් සමාජයේ ආරම්භය සනිටුහන් කරයි. එසේ වුවද මානව සංහතියේ ඉපැරණිතම සංස්ථාව ලෙස විවාහය

හඳුන්වා දිය හැක්කේ ජාතියක හෝ සංස්කෘතික කණ්ඩායමක (Cultural Group) හෝ සම්ප්‍රදාය (Tradition) හා පරමාදර්ශයන් (Ideals) එතුළින් මූර්තිමත් කරන බැවිනි (Karunanayake, 2000: 13).

සෑම සමාජයක් තුළම එහි වැඩිහිටි මානවයන් ඔවුන්ගේ පැවැත්මේ වඩාත් ප්‍රිය උපදවන අවස්ථාව ලෙස විවාහය සලකනු ලබයි. ඊට හේතු වන්නේ තනිව තම අවශ්‍යතා ඉටු කරගත් පුද්ගලයා හට නෛතික හා සංස්කෘතිකමය වශයෙන් පිළිගත් සංස්ථාවකට ඇතුල්වීමට අවකාශ ලැබීමයි. ඒ අනුව ස්වකීය කලත්‍රයා හා එකට ජීවත්වෙමින්, දරුවන් බිහිකරමින් හා ඔවුන් වර්ධනය කරමින් මානව පැවැත්ම උදෙසා දායකත්වයක් දක්වනු ලබයි.

**පූර්ව යටත්විජිත අවධියෙහි විවාහ සංස්ථාව හා ඒ ආශ්‍රිත වෙනස්කම්**

ලංකාවේ ලිඛිත ඉතිහාසය තුළ ඉපැරණිම විවාහ මංගල්‍යයක තොරතුරු ක්‍රි.පූ.6 වැනි සියවසින් වාර්තා වේ. ඓතිහාසික මූලාශ්‍රය වූ මහාවංසයෙහි, විජයාවතරණ කථාවෙහි එකල ලක්දිව මුල්ම පදිංචිකරුවන් අතර පැවති විවාහ මංගල්‍යයක් (බුද්ධදත්ත හිමි,1959:44) ගැන සඳහන් වේ. එසේ යක්ෂ ගෝත්‍රික ජනතාව අතර පැවති විවාහ මංගල චාරිත්‍රධර්ම මාතෘ මූලික සමාජ රටාවක තොරතුරු කියාපායි. එසේ කිව හැක්කේ මහාවංසයෙහි දැක්වෙන පරිදි එම සමාජයෙහි ආවාහ මංගල්‍යයෙහි කටයුතු මවගේ මූලිකත්වයෙන් (බුද්ධදත්ත හිමි,1959:45) සිදු වී ඇති බැවිනි. වර්තමාන ශ්‍රී ලාංකේය සමාජය තුළ විවාහයකදී දීගයන මණාලිය ඇරලීම සඳහා ඥාතීන් සමග මණාලියගේ මව මණාලයාගේ නිවසට නොයන අතර පියා සහ ඥාතීන් පමණක් එම අවස්ථාවට එක් වෙයි. එය පීතෘමූලික සමාජ රටාවේ ක්‍රියාත්මක චාරිත්‍රයකි. පැරණි ලක්දිව යක්ෂ ගෝත්‍රික විවාහ පිළිබඳ අදහස් දක්වන බද්දේගම විමලවංස හිමියන් පෙන්වා දෙන්නේ විවාහ මංගලෝත්සවයකදී මණාලියගේ මෑණියන්ට මූලිකත්වය හිමි වී තිබූ බවයි (විමලවංස හිමි,1996:79). මේ හා සමානවම වර්තමානයේ ක්‍රියාත්මක බින්න විවාහ ක්‍රමය තුළ මාතෘ මූලික බැව් දැකිය හැකි බව (හේරත්,1999:31). පවසති.

එමෙන්ම මුල් කාලීන ශ්‍රී ලාංකේය සමාජයෙහි විවාහයේදී කුලය යන සාධකය ප්‍රධාන වන බැව් ඓතිහාසික මූලාශ්‍ර පෙන්වා දේ. විශේෂයෙන්ම එය රාජකීය මංගලෝත්සවයන්හිදී ''සුදුසු සමකුල කුමරිය ලැබිය යුතුය'' යන ඉන්දීය සම්ප්‍රදාය අනුගමනය කිරීමක් බැව් පෙනී යයි (චන්ද්‍රසිරි හිමි, 2006:63). අනුරාධපුර අගභාගයේදී කුලවංශය හා සමාන අර්ථයෙන් යෙදී ඇත්තේ සම ද (සම ජාති) හා සම කුලය යන්නයි. එයින් ගම්‍ය වන්නේ සම පවුල, සම උපත හෝ සමවංශය (ශ්‍රී ලංකාවේ ඉතිහාසය,2000:191) බව ඉතිහාසඥයන්ගේ අදහසයි. විශේෂයෙන්ම සිහසුන හිමිවීමේදී හා දේපල උරුම වීමේදී ජන්මය පිළිබඳ විමසිලිමත් වීම විවාහයේදි ඉතා වැදගත් කරුණක් බව මහාචාර්ය හේම එල්ලාවල සඳහන් කරයි (එල්ලාවල උපුටා ගත්තේ මුණසිංහ,1998:118). එම විවාහයන්හි කෘත්‍යාත්මක අවශ්‍යතාවයක් ලෙස පාලන සංවිධාන අතර ඇති සම්බන්ධතා වඩාත් ශක්තිමත් කිරීම ප්‍රධාන අරමුණක් වන බව (මේදානන්ද හිමි,2003:424) සඳහන් කළ හැකිය. එහෙත් සමකුල නොවන ස්ත්‍රියක් විවාහ කරගැනීම හේතුවෙන් රාජ්‍යත්වය පවා අහිමි වූ අවස්ථාවක් ලෙස සාලිය-අශෝකමාලා කතා පුවත පෙන්වා දිය හැකිය (බුද්ධදත්ත හිමි,1959:174). සමකුල නොවන ස්ත්‍රියක් දෙමාපිය හා වර්ගයාගේ අකමැත්ත මත ප්‍රේම සම්බන්ධතාවය ප්‍රමුඛ කරගනිමින් සිදු කළ පළමු අවස්ථාව මේ යැයි ඓතිහාසික මූලාශ්‍ර නිරීක්ෂණයෙන් පෙනී යයි. එමෙන්ම විවාහයේදී ඥාතීත්වය හා කුලය අතර අන්‍යෝන්‍ය වශයෙන් ධනාත්මක සහසම්බන්ධතාවක් පැවති බව පර්යේෂණාත්මක ලිපි මඟින් අනාවරණය කරයි. හේරත් දක්වන පරිදි පැරණි සිංහල සමාජ සංවිධානයේ විවාහ සම්බන්ධතා තීරණය කිරීම සහ ඒ තුළින් තීරණය වන්නා වූ ඥාතීත්වයේ සීමාව කුලයේ සීමාව දක්වාත්, කුලයේ සීමාව ඥාතීත්වයේ සීමාව දක්වාත් ව්‍යාප්ත වී ඇත (හේරත්,1999:163).එය තවදුරටත් සනාථ කරමින් මෙන්ඩිස් සඳහන් කරන්නේ ''කුල භේදය වනාහි, සිය කණ්ඩායම්වලට පිටස්තර විවාහයන් සඳහා ඉඩ නොතබා එකී ව්‍යුහය එකට රඳවා ගත් ව්‍යවස්ථාවක්'' බවයි (Mendis,1940:85). මෙරට විවාහයට බලපෑ කුල ක්‍රමය පිළිබඳව සාකච්ඡා කිරීමේදී ඒ ඒ කුලවලට අයත්වූවන් තමතමන්ගේ යහපතටත්, අභිරුචියටත් පාඩු වූවද පවුලේ හෙවත් කුල පැවැත්මේ යහපත තකා විවාහවීම්වලින් මෙකී සම්බන්ධතාව රැකගත් බව පෙනේ. මෙසේ සම කුලවලින්ම විවාහ කරගැන්ම කුල විසින්ම

පවත්වාගෙන ගිය එක්තරා අලිඛිත නීතියක් විය. මේ අනුව තත්කාලීන සමාජයේ විවාහය සඳහා කුලය ප්‍රධාන වූවා සේ ම කුල ක්‍රමයක සමාජයක් පවත්වාගෙන යෑම සඳහා විවාහය මූලික වී ඇත.

සම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජය තුළ ප්‍රධාන වශයෙන් ගිණිය හැකි විවාහ ක්‍රම දෙකකි. එයින් පළමුවැන්න දීග විවාහයයි. දීග විවාහය පීතෘවාසික විවාහය යැයි රැල්ෆ් පීරිස් පෙන්වා දේ (පීරිස්,2016:217). මෙය විවාහ ක්‍රමයකටත් වඩා විවාහයෙන් පසුව පදිංචිය, අයිතිය, දේපළ ආදිය මුල් කොට ගනු ලබන එක්තරා තීරණයකි. විවාහයෙන් පසුව නව යුවළ පදිංචි වන ස්ථානය අනුව මේ විවාහ ක්‍රමය විග්‍රහ කළ හැකි අතර, ඒ අනුව ස්ත්‍රිය ස්වකීය පියාගේ නිවසින් ගොස් ස්වාමිපුරුෂයා හා ඔහුගේ නෑදෑයන් සමඟ පදිංචි වීමට යාම දීග විවාහයයි. ඒ නිසාම පීතෘ මූලික ද වේ. දීග විවාහයේදී බිරිඳගේ උරුමය පිළිබඳ අයිතිවාසිකම් නැතිවී යන අතර දේපළවල අයිතිය ස්වාමිපුරුෂයාට අයත් වේ. එහෙත් 1938 අංක 39 දරණ උඩරට නීති ප්‍රකාශන සංශෝධනයන්ට අනුව දීග විවාහයකින් පියා සතු වස්තුව දුවට අහිමි වුවද, පුරාණ නීතියට අනුව දීග ගිය දුවට පියා සතු දේපළ හෙවත් බිනි අයිතිවාසිකම් ලබාගැනීමේ ක්‍රම තිබුණි (ජයතුංග,2005:38).

සම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජය තුළ පැවති ප්‍රධාන දෙවැනි විවාහ ක්‍රමය බින්න විවාහයයි. බින්න යනු පාලි, සංස්කෘත භාෂාවලින් බිඳී ගිය වචනයකි (සේනාරත්න,1996:339). එයින් බිඳී ගිය, කැඩුණු, විනාශ වූ යන අර්ථය පැවසෙයි. භින්නවීම යනු කැඩී යාමයි. පිය පරපුරේ සම්ප්‍රදාය බින්න විවාහය නිසා කැඩී යයි. මෙම මූලික අර්ථය වෙනස් වී මනාලයා මනාලියගේ නිවසේ නවතිනවා යන තේරුම ගෙන දෙතැයි බද්දේගම විමලවංස හිමියෝ දක්වති (විමලවංස හිමි උපුටා ගත්තේ චන්දසිරි හිමි,2006:91). බින්න යන සිංහල වචනයට අර්ථ සපයන වැලිවිටියේ සෝරත නාහිමියෝ ''පුරුෂයා සිය මව්පියන්ගෙන් වෙන්ව භාර්යාවගේ නිවසෙහි නැවතීම යැයි සඳහන් කරති'' (විමලවංස හිමි,1996:79). යුරෝපීයන්ගේ පැමිණීමටත් පෙර සිටම මෙම විවාහ ක්‍රමය ශ්‍රී ලංකාවේ පැවතුණ බව ඓතිහාසික ග්‍රන්ථවල පෙන්වා දී ඇති අතර, බින්න විවාහය බොහෝ විට සිදු වූයේ වැඩි දේපලක් නැති පිරිමි පක්ෂය සහ ආර්ථිකමය වරප්‍රසාද හිමි ස්ත්‍රීන් අතර බව සඳහන් වේ. බින්න විවාහය මාතෘවාසික විවාහය යැයි රැල්ෆ් පීරිස් පෙන්වා දේ (පීරිස්,2016:217). සිය නිවස පාලුවීමට ඉඩ නොදීම, වයසට පත්වීමේදී රැකවරණය ලබාගැනීම, ඉඩකඩම්, වතුපිටි හා දේපළ ආරක්ෂා කරගැනීම, සිය පරපුරෙහි හා ඉඩකඩම් ආදියෙහි අභිවෘද්ධිය ඇති කරගැනීම ආදිය බින්න විවාහය සඳහා බලපෑ හේතු ලෙස සඳහන් වේ (චන්දසිරි හිමි,2006:95).

මුල් කාලීන ශ්‍රී ලාංකේය සමාජය තුළ බහුල වශයෙන් දෙමාපිය කැමැත්ත මත ඇවැස්ස ඥාතීන් අතර විවාහ සිදු වූ බවත්, ඊට පටහැනිව ප්‍රේම සම්බන්ධතා හේතුවෙන් දෙමාපිය අකමැත්ත මත ඇවැස්ස ඥාතීන් අතර විවාහ සිදු වූ බවත් මහාවංසයෙහි සඳහන් වේ (බුද්ධදත්ත හිමි,1959:53). එය උන්මාද චිත්‍රා හා දීඝගාමිනී කතා පුවතින් ප්‍රකට වේ. ශ්‍රී ලාංකේය සම්ප්‍රදායික සමාජය තුළ ඇවැස්ස විවාහය බහුලව ව්‍යාප්ත වූ මෙන්ම පිළිගත් විවාහ ක්‍රමයක් ලෙස සාහිත්‍ය තොරතුරුවලින් අනාවරණය වේ. ඇවැස්ස විවාහය සඳහා බලපෑ හේතු ලෙස ඉඩකඩම් සහ දේපලවල අයිතිය බාහිර පාර්ශ්වයකට අයත් වීම වැළැක්වීම හා එකම කුල පරපුරක් තුළ රඳවා ලබා ගැනීමත්, කුල පරම්පරා මිශ්‍රණය වැළැක්වීමත්, දෙපාර්ශ්වයේම උදවිය ඥාතීන් වීම නිසා මතවාද, ගැටුම් හා නොරිස්සුම්වලට ඇති අවස්ථා සීමාසහිත වීමත් හඳුනාගත හැකිය. ඇවැස්ස ඥාතීත්වය අනුව විවාහය සිදු කිරීමේදී සහෝදරයෙකුගේත්, සහෝදරියකගේත්, දූ දරුවන් අතර විවාහය සිදු වන බැවින් පරම්පරාව හා ඥාතීත්වය නොනැසී ගමන් ගන්නා බව සම්ප්‍රදායික සමාජය පිළිගත් කරුණකි. කෙසේ වුවද වර්තමානයේ මෙම විවාහ ක්‍රමය අභාවයට යන ආකාරයක් හා ඊට වැඩි කැමැත්තක් නොදක්වන බවක් ද පෙනී යයි (ආරියපාල,1962:290).

මීට අමතරව බහු විවාහ ක්‍රමයක්ද ශ්‍රී ලංකාවේ පැවති බව ඓතිහාසික මූලාශ්‍ර දක්වයි. එය බහු පුරුෂ (එකගෙයි කෑම) හා බහු ස්ත්‍රී ලෙස විවාහ ක්‍රම දෙකකින් යුක්ත වන අතර මහනුවර යුගයේ වඩාත්ම ව්‍යාප්ත වූ විවාහ ක්‍රමය මෙය වේ. එකගෙයි කෑමේ විවාහ ක්‍රමය යනු සහෝදරයන් කිහිපදෙනෙකු සිටින පවුලකට එක් බිරිඳක් කැන්දාගෙන ඒමයි (සේනාරත්න,2001:07). මෙම විවාහ ක්‍රමය බින්න හා දීග යන විවාහ ක්‍රම දෙකෙන්ම සිදු කරයි (චන්දසිරි හිමි,2006:98). එකගෙයි කෑමේ විවාහ ක්‍රමය බහු

පුරුෂ සේවන විවාහය ලෙස ද රැල්ෆ් පීරිස් හඳුන්වයි (පීරිස්,2016:217). ඒ හරහා එක් පරම්පරාවකින් තවත් පරම්පරාවකට දේපළ බෙදා හැරීම (දේපළ බෙදී යාම වැළැක්වීම), දේපල රඳවා ගැනීම, මිනිසුන් අතර ඇති සහයෝගය (සහෝදර සම්බන්ධතාවය ආරක්ෂා කිරීම), සහෝදරයන් කුඹුරෙහි එකට වැඩකිරීම හා ධාන්‍ය එකම තැනකට රැස්කිරීම (කෘෂි සමාජය තුළ අවශ්‍ය ශ්‍රම ශක්තිය සපයා දීම), දරුවන් රැකබලාගැනීමේ පහසුව, එක් කාන්තාවක් පවුලකට ආර්ථිකමය වාසිදායක වීම ආදිය මෙම විවාහ ක්‍රමයේ වාසිදායක තත්ත්වයන්ය. බහු භාර්යා විවාහයේදී සිදුවන්නේ එක් පුරුෂයෙක් ස්ත්‍රීන් කිහිපදෙනෙක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සමඟ සබඳතා ඇති කරගැනීමයි. මෙහිදී සුවිශේෂි වන්නේ ස්ත්‍රියට සහකරු තෝරාගැනීමේ තීරණය ගැනීමට බලයක් හෝ අධිකාරියක් නොමැති වීමයි. පවුල් ඒකකයට පරිභාහිරව ඇති විය හැකි අනියම් ලිංගික සබඳතා පාලනය කිරීම වැනි පරමාර්ථයන් මෙම විවාහ ක්‍රමය තුළින් සාක්ෂාත් වීම සමාජ ක්‍රමයේ පැවැත්මට රුකුලක් වී ඇත.

ඓතිහාසික මූලාශ්‍ර ඔස්සේ (මහාවංසො,1959) විවාහ ක්‍රම පිළිබඳ නිරීක්ෂණය කිරීමේදී පෙනී යන්නේ ඉන්දීය විවාහ ක්‍රම අතර ප්‍රචලිත රාක්ෂස විවාහ ක්‍රමය මුල් කාලීන ශ්‍රී ලාංකේය සමාජයේද පැවති බවයි. ඊට උදාහරණ වශයෙන් පණ්ඩුකාභය කුමරුගේ හා ස්වර්ණපාලි කුමරියගේ විවාහය පෙන්වා දිය හැකි වන්නේ කුමරු විසින් කුමරියගේ කැමැත්තකින් තොරව විවාහය සිදු කිරීමයි.

කෙසේ වුවද මුල් කාලීන ශ්‍රී ලාංකේය සමාජයෙහි විවාහය සමාජ සංස්ථාවක් ලෙස සළකා බැලීමට වඩා පුද්ගලික සංස්ථාවක් ලෙස සළකා බැලීම සුදුසු බව අපගේ අදහසයි. මක්නිසාද යත් රාජ්‍යත්වය, රාජ්‍ය පාලනය හා විවාහය අතර සහසම්බන්ධතාවක් පැවතුනද විවාහයේ අපේක්ෂාවන් පෞද්ගලික සීමාවකින් ක්‍රියාත්මක වී ඇති හෙයිනි. ඒ අනුව විවාහය මඟින් ඉටුවන සමාජ කාර්යභාර්ය රාජ වංශය කෙරෙහි ලඝු කර ඇති බවක් උක්ත කරුණු තුළින් ගම්‍ය වේ. විශේෂයෙන්ම රාජකීය කුල පරම්පරාවන්හි ආරක්ෂාවත්, රාජ්‍ය බලය රැකගැනීමත්, වස්තු හා දේපල ආරක්ෂා කරගැනීමත් යන රාජකීය විවාහය තුළ අපේක්ෂා කළ කරුණු සමාජ සංස්ථාවකින් අපේක්ෂා කළ නොහැකි බව අපගේ අදහසයි.

පූර්වයෙහි සඳහන් කළ පරිදි ඇවැස්ස ඥාතීන් අතර සිදුවන විවාහ, බින්න විවාහ, දීග විවාහ ආදී විවාහ ක්‍රම මෙන්ම රාක්ෂස විවාහ හා ගාන්ධර්ව විවාහ (ශ්‍රී අලවත්තගේ,2007:140) ද පුරාතන අවධියෙහි ශ්‍රී ලාංකේය සමාජය තුළ හඳුනාගත හැකි වූ විවාහයන්ය. එම විවාහ ක්‍රමයන් ප්‍රධාන වශයෙන් සාමාන්‍ය ජනතාව අතර බොහෝ විට සිදු වුවත් ඇතැම් අවස්ථාවන්හිදී රාජකීය විවාහයන් තුළද සළකා බලා ඇති බව උක්ත කරුණු තුළින් සනාථ වේ.

**යටත්විජිත සමයේ විවාහ සංස්ථාව හා ඒ ආශ්‍රිත වෙනස්කම්**

සම්ප්‍රදායික ශ්‍රී ලාංකේය සමාජය තුළ පැවති විවාහ ක්‍රම අභියෝගයට ලක්කිරීමක් මෙම අවධිය තුළ සිදු වීම කැපී පෙනෙන ලක්ෂණයකි. එය අනෙකුත් සංස්ථාවන්ටද ඍජු හා වක්‍රව බලපෑම් කළ බැව් ඓතිහාසික සාධක සනාථ කරයි. ධනවාදී (Capitalism) සහ වික්ටෝරියානු ආචාරධර්ම (Victorian values) පදනම් කරගත් පාලන රටාවක් මෙරට ස්ථාපිත වීම ම එකී තත්ත්වයන්ගේ තීව්‍ර බව වැඩිකිරීමට තුඩු දුන් බව පෙනී යයි. මෙම අවධිය තුළ හඳුන්වා දුන් සුවිශේෂී අණ පනත් මඟින් සමාජ ක්‍රමය වෙනස් කිරීමෙහිලා ප්‍රබල දායකත්වයක් සැපයීය. ඒ හරහා එතෙක් පැවති බහු විවාහ ක්‍රමය වෙනුවට ඒක විවාහ ක්‍රමයක් (Monogamy) නැතහොත් ඒකපත්නිව්‍රතය (Monogamous)ක් කෙරෙහි ශ්‍රී ලාංකේය ජනතාව යොමු කරන ලදී. මෙම විවාහ ක්‍රමයට අනුව එක් ස්ත්‍රියක් විවාහ විය යුත්තේ එක් පුරුෂයෙක් සමඟ පමණක් වන අතර එක් පුරුෂයෙකුට විවාහ විය හැක්කේ එක් ස්ත්‍රියක් සමඟ පමණි. ඔවුන්ට දෙවන විවාහයක් සිදු කරගැනීමට අවශ්‍ය නම් පළමු විවාහයෙන් දික්කසාද වීම අත්‍යවශ්‍යය. මක්නිසාද යත් විවාහය ලියාපදිංචි කර ඇති නිසාවෙනි. විවාහය නෛතික වශයෙන් ලියාපදිංචි කිරීම ලන්දේසි යුගයේ ආරම්භ වුවත් එය වර්ධනීය තත්ත්වයකට පත්වන්නේ ඉංග්‍රීසි පාලන සමයේදීය (Abeyasekara,2015). ඉංග්‍රීසින් විසින් මෙරටට විවාහ ලියාපදිංචිය හඳුන්වා දුන්නේ 1882 වර්ෂයේදීය. එම නෛතිකමය තත්ත්වයට අනුව ලියාපදිංචි නොකළ විවාහ මඟින් බිහිවන දරුවන් නීත්‍යානුකූල නොවේ. ඒ හේතුවෙන්ම මෙම අවධිය තුළ ශ්‍රී

ලංකාවේ නීත්‍යානුකූල නොවූ දරුවන් ප්‍රමාණය ඉහළ යන ලද්දේ බොහෝ දෙමාපියන් ඔවුන්ගේ විවාහයන් ලියාපදිංචි නොකළ නිසාවෙනි. මේ තත්ත්වය මත ඉංග්‍රීසින් විසින් ගෙන ආ එම නීතිය අවලංගු කරගැනීමට සිදු විය. කෙසේ වුවද නැවතත් 1895 දී විවාහ ලියාපදිංචිය ගෙන එන ලද අතර නැවතත් එය 1896 දී අවලංගු කරන ලදී. වර්තමානය වන විට ශ්‍රී ලංකාව තුළ විවාහය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවන අතර ඇතැම් ලියාපදංචි නොකළ විවාහ උසාවිය මඟින් විවාහයන් ලෙස පිළිගනු ලබයි. ඊට අනුව අද වන විට සිදු කළ හැකි විවාහ වර්ග දෙකකි. එනම් ලියාපදිංචි විවාහ සහ චාරිත්‍රානුකූල විවාහයි.

වත්මන් සමාජය තුළ ස්ත්‍රියක් හා පුරුෂයෙක් විවාහයට එළඹීමේදී විවාහ, උපත් හා මරණ රෙජිස්ට්‍රාර්වරයෙක් යටතේ තම විවාහය ලියාපදිංචි කරනු ලබන්නේ ලියාපදිංචි විවාහ ක්‍රමවේදය යටතේය. එහිදී ඔවුන්ට විවාහ සහතිකයක් හිමි වන අතර එය පුද්ගල ජීවිතයේ ඉතා වැදගත් ලියවිල්ලක් සේ සළකනු ලබයි. දැනට ශ්‍රී ලංකාවේ විවාහ ලියාපදිංචි කිරීම් පනත් තුනක් යටතේ සිදු කරනු ලබයි. එනම්, 1907 අංක 19 දරණ විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනත, 1952 අංක 44 දරණ උඩරට විවාහ හා දික්කසාද පනත සහ 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද පනතයි. 1907 අංක 19 දරණ විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතට අනුව සාමාන්‍ය නීතිය, දෙමළ පුද්ගලයන්ට අදාළ වන තේසවලමෙයි නීතිය හා විවිධ පුද්ගලික නීතිවලින් පාලන වන අය අතර සිදුවන මිශ්‍ර විවාහ පාලනය කරනු ලබයි. උදාහරණයක් ලෙස උඩරට නීතියෙන් පාලනය වන ස්ත්‍රියක් හා පහතරට නීතියෙන් පාලනය වන පුරුෂයෙක් විවාහ වන විට ඒම විවාහය මෙම පනත යටතේ සිදු කරනු ලබයි. 1952 අංක 44 දරණ උඩරට විවාහ හා දික්කසාද පනත යටතේ විවාහ වීමට හැකිවන්නේ උඩරට නීතියෙන් පාලනය වන පුද්ගලයන්ට පමණි. විවාහය සිදු කළ හැකි වන්නේද උඩරට ප්‍රදේශයක පමණි. මෙම විවාහ සිදු කරනු ලබන්නේ ඒ සඳහා පත් කර ඇති උඩරට විවාහ ලේකම්වරුන් විසින්ය. 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ විවාහ වීමට හැකිවන්නේ මුස්ලිම් ජාතීන්ට පමණි. විවාහ සිදු කිරීම මුස්ලිම් විවාහ ලේකම්වරුන් විසින් සිදු කරන අතර ලියාපදිංචිය සිදු කරන්නේ නිකා උත්සවය ලෙස හඳුන්වන මුස්ලිම් විවාහ උත්සවය පැවැත්වීමෙන් පසුවයි.

විවාහය ලිඛිතව ලියාපදිංචි කිරීමක් සිදු නොකර පුද්ගලයා අයත් වන ආගම, ජාතියට අනුව චාරිත්‍ර වාරිත්‍ර පමණක් සිදු කරමින් එළඹෙන විවාහ චාරිත්‍රානුකූල විවාහ වේ. මෙම විවාහයන්ද පූර්වයෙහි සඳහන් කළ පනත් ත්‍රිත්වය යටතේ වෙනස්කම් සහිතව ක්‍රියාත්මක වේ. 1907 අංක 19 දරණ විවාහ ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ ලියාපදිංචි නොකළ චාරිත්‍රානුකූල විවාහ වලංගු නොවේ යන්න සඳහන් වී නැත. එහෙයින් මෙම පනත යටතේ සිදුකර ඇති චාරිත්‍රානුකූල විවාහ උසාවිය විසින් පිළිගනු ලබයි. 1952 අංක 44 දරණ උඩරට විවාහ හා දික්කසාද පනත යටතේ චාරිත්‍රානුකූල විවාහ පිළිනොගන්නා අතර ඒවා උඩරට ප්‍රදේශයක ලියාපදිංචි කිරීම අනිවාර්ය වේ. 1951 අංක 13 දරණ මුස්ලිම් විවාහ හා දික්කසාද පනත යටතේ විවාහයක් ලියාපදිංචි කර නොමැති වීම මත පමණක් එම විවාහය අවලංගු නොවන ලෙස දක්වා ඇත. එහෙයින් ඉස්ලාම් නීතියට අනුව ලියාපදිංචි නොකළ විවාහ චාරිත්‍රානුකූල විවාහයක් ලෙස උසාවිය මඟින් පිළිගනු ලබයි (https://roar.media).

කෙසේ වුවද විවාහය ලියාපදිංචි වීම හා ඒක විවාහ ක්‍රමයත්, ඉඩම් පනත් ස්ථාපිත වීමත් සමඟ එහි අවාසිදායක තත්ත්වයක් ස්ත්‍රීන් විෂයෙහි හටගත් බව ඓතිහාසික දත්ත සාක්ෂ්‍ය දරයි. ඒ අනුව උරුමය පිළිබඳ අයිතිය නිතැතින්ම පුරුෂයාට හිමිවීමත් පියපේරුවේ උරුම රටාවක් නිර්මාණය වීමත් සිදු විය. ගෘහමූලිකත්වය ද පුරුෂයාට හිමි වූ අතර ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් වූ සමාජ ක්‍රමයක ආරම්භ මෙම අවධිය සටහන් වූ බැව් සඳහන් කළ හැකිය.

**විවාහ සංස්ථාවෙහි මෑත කාලීන ප්‍රවනතා**

සාමාන්‍ය විවාහ නීතිය, උඩරට විවාහ නීතිය, සහ මුස්ලිම් විවාහ නීතිය යනුවෙන් ශ්‍රී ලංකාව තුළ විවාහය සම්බන්ධ වූ පැහැදිලි නීති රීති පද්ධතීන් තුනක් ක්‍රියාත්මක වේ. බොහෝ දුරට රෝම ලන්දේසි නීතිය සහ ඉංග්‍රීසි නීතියේ ආභාෂය ඇතිව සකස් වූ සාමාන්‍ය නීතිය, පහතරට සිංහල, දෙමළ ජාතිකයන් අතර වන විවාහ සඳහා මෙන්ම ජාතීන් සහ ආගමික කණ්ඩායම් දෙකක් අතර සිදු කෙරෙන විවාහ සඳහා බලපවත්වනු ලබයි. උඩරට සිංහලයන්ට සිය කැමැත්ත අනුව සාමාන්‍ය විවාහ

නීතිය යටතේ හෝ උඩරට චාරිත්‍රානුකූල විවාහ නීතිය යටතේ විවාහ විය හැකිය. ශ්‍රී ලංකාව තුළ ජීවත් වන මුස්ලිම් ජාතීන්ගේ විවාහ සඳහා බල පවත්වන්නේ මුස්ලිම් විවාහ නීතියයි. ලොව ප්‍රධාන වශයෙන් ඒක විවාහ සහ බහු කලත්‍ර විවාහ වශයෙන් විවාහ වර්ග දෙකක් පැවැතුණ ද, ශ්‍රී ලංකාවේ ජනතාව අතර බහු කලත්‍ර විවාහ දක්නට නොලැබෙන තරම් ය (ජන හා නිවාස සංගණනය,2012:67).

ශ්‍රී ලාංකේය වත්මන් සමාජ තන්ත්‍රයෙහි පවත්නා සෑම සංස්ථාවක්ම මුල්කාලීන සමාජ ක්‍රමයේ පැවති තත්ත්වයන්ට වඩා බොහෝ සෙයින් වෙනස් වී ඇති ආකාරයක් නිරීක්ෂණය වේ. එය විවාහ සංස්ථාවටද පොදු වූ කරුණක් වී ඇති ආකාරය මෙම පරිච්ඡේදය තුළ සාකච්ඡාවට බඳුන් කර ඇත. ශ්‍රී ලංකාව පුරාතන අවධියෙහිදී පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි යන විදේශීය ජාතීන්ගේ යටතට පත් වූවායින් පසුව විවාහ සංස්ථාව තුළ ඇති වූ වෙනස්කම් පූර්ව පරිච්ඡේදවල දී සාකච්ඡා කළ අතර කාර්මීකරණය, වාණිජකරණය, නවීකරණය, නාගරීකරණය, බටහිරකරණය, ආදී පෙරදිගින් උත්පන්න වූ බොහෝ නව්‍ය සංකල්පයන් විවෘත ආර්ථිකයත් සමඟ මෙරටට සංකේන්ද්‍රණය වී, එම සංකල්පයන්ගේ සම්මිශ්‍රණයකින් යුත් නවතම සමාජ ක්‍රමයක් හා ඒ ආශ්‍රිත වෙනසකට බඳුන් වූ සංස්ථාවන් ද නිර්මාණය විය. මේවාට අමතරව මෙරට සමාජයට මුහුණ දීමට සිදුවූ ස්වභාවික උපද්‍රව, දේශපාලන ප්‍රචණ්ඩත්වයන්, ප්‍රජාවිද්‍යාත්මක වෙනස්කම් සහ පුද්ගලමය වශයෙන් සිදු වූ චින්තනමය වෙනස්කම් හා සංකීර්ණ වූ හා වෙනස් වූ ජීවන විලාසිතාවන් විවාහ සංස්ථාවෙහි කැපී පෙනෙන වෙනසක් ඇති කිරීමට තුඩු දී ඇති අයුරු තවදුරටත් මෙහිදී සාකච්ඡා කෙරෙනු ඇත.

**ප්‍රජා විද්‍යාත්මක වෙනස්කම්**

විවාහක තත්ත්වය යනු ජීව විද්‍යාත්මක, සමාජීය, ආර්ථික, නෛතික, සහ ආගමික යනාදී සාධකයන් සමඟම සම්බන්ධ වන ප්‍රජා විද්‍යාත්මක ලක්ෂණයක් මෙන්ම ජනගහන වෙනස්වීම් කෙරෙහි ද ප්‍රධාන වශයෙන් බලපාන සාධකයක් ලෙස සැලකිය හැක. රටක සාඵල්‍යතාව කෙරෙහි සෘජු ලෙස ද මර්ත්‍යතාව සහ සංක්‍රමණය කෙරෙහි ද විවාහක තත්ත්වය බලපායි. ඒ හැරුණු විට අධ්‍යාපන තත්ත්වය, ශ්‍රමබලකා සහභාගිත්වය වැනි සමාජීය සහ ආර්ථික ලක්ෂණයන් කෙරෙහි ද පුද්ගලයකුගේ විවාහක තත්ත්වය බලපානු ලබයි (ජන හා නිවාස සංගණනය,2012:67).

1871 මාර්තු 27 වන දින පවත්වන සංගණනයට අනුව 2,400,380 ක් වූ ජනගහනය 2012 මාර්තු 20 වන විට 20,359,439ක් වී ඇත. එය දස ගුණයකට ආසන්න වර්ධනීය තත්ත්වයකි. එමෙන්ම ඉහළම වාර්ෂික වර්ධන අනුපාතිකය වූ 28% වාර්තා වී ඇත්තේ 1953 දී ය. ඉන්පසු එය ක්‍රමයෙන් අඩු වී 2012 සංගණනයේදී 7%ක් ලෙස සටහන් වී ඇත. ජනගහනයේ ස්වභාවික වර්ධනයේ පහළ යාම හා දිවයිනෙන් පිටතට සිදු වන සංක්‍රමණ ජනගහනයේ වර්ධන වේගය පහළ මට්ටමට ගෙන ආ නමුත් ජනගහනය සංඛ්‍යාත්මකව ක්‍රමිකව වර්ධනය වීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කර ඇත (ජන හා නිවාස සංගණනය,2012:38). මේ සඳහා විවාහක තත්ත්වය කවරාකාරයේ බලපෑමක් සිදු කර ඇතිද යන්න හා ඒ ආශ්‍රයෙන් විවාහ සංස්ථාව තුළ උත්පන්න වූ වෙනස්කම් මොනවාද යන්න පහත පරිදි සාකච්ඡා කළ හැකිය.

**විවාහ වන වයස**

සාමාන්‍ය නීතිය සහ උඩරට චාරිත්‍රානුකූල විවාහ නීතිය යටතේ විවාහය සඳහා පනවා ඇති අවම වයස සීමාව අවුරුදු 18ක් වේ. මුස්ලිම් කාන්තාවන්ට වයස අවුරුදු 12 සම්පූර්ණ වූ පසු විවාහ විය හැකි නමුත් ක්වාසි මණ්ඩලයේ අනුමැතිය ලබා ඇති අවස්ථාවල දී අවුරුදු 12ට අඩු ගැහැණු ළමුන් සඳහා වුවද විවාහ විය හැකිය. විවාහයක් ලියාපදිංචි වීම අනිවාර්යය නොවන අතර බෞද්ධ, හින්දු හෝ ක්‍රිස්තියානි ආගමික චාරිත්‍ර වාරිත්‍ර අනුව සිදුකෙරන චාරිත්‍රානුකූල විවාහ ද වලංගු විවාහ ලෙස සැළකේ (ජන හා නිවාස සංගණනය,2012:67).

**වගුව 1. ස්ත්‍රී පුරුෂභාවය අනුව ප්‍රථම විවාහයේ සාමාන්‍ය වයස (Singulate Mean Age at Marriage-SMAM) - 1901-2012**

| වර්ෂය | විවාහ වීමේ සාමාන්‍ය වයස (අවුරුදු) | | |
|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | වෙනස |
| 1901 | 18.5 | 24.6 | 6.1 |
| 1911 | 19.9 | 26.9 | 7.0 |
| 1921 | 20.6 | 27.5 | 6.9 |
| 1946 | 20.7 | 27.0 | 6.3 |
| 1953 | 20.9 | 27.2 | 6.3 |
| 1963 | 22.1 | 27.9 | 5.8 |
| 1971 | 23.5 | 28.0 | 4.5 |
| 1981 | 24.4 | 27.9 | 3.5 |
| 1985 | 25.5 | 28.8 | 3.3 |
| 1994 | 24.7 | 28.3 | 3.6 |
| 2001 | 23.8 | 27.6 | 3.8 |
| 2012 | 23.4 | 27.2 | 3.8 |

මූලාශ්‍රඃ 1901-1921 සංගණන සංඛ්‍යාලේඛන - Dixon in Caldwell, 1992: 55.
1946-1981 සංගණන සංඛ්‍යාලේඛන - Nadarajah in Caldwell, 1992: 55.
1985 සංගණන සංඛ්‍යාලේඛන - Karunanayake, 2000: 48
1994-2012 සංගණන සංඛ්‍යාලේඛන - Department of Census and Statistics-Key Info,2012:28

උක්ත වගු සටහනට අනුව 1901 වර්ෂය වන විට ස්ත්‍රීන්ගේ විවාහ වීමේ සාමාන්‍ය වයස 18.5ක පහල අගයක් ගෙන තිබූ නමුත් පුරුෂයන්ගේ විවාහ වීමේ සාමාන්‍ය වයස 24.6ක් වී ඇත. එහි වෙනස 6.1කි. මෙම වෙනස තවත් තීව්‍ර වන්නේ 1911දී වෙනස්වීමේ අගය 7ක් ලෙස සටහන් වීමෙනි. එය මේ වන තෙක් පැවති ඉහලම වෙනස්වීමයි. කෙසේ වුවද මෑතකාලීන වෙනස්කම් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමේදී 1985 වර්ෂයේ සිට ස්ත්‍රීන්ගේ විවාහ වීමේ වයස මෙන්ම පුරුෂයන්ගේ විවාහවීමේ වයසද ක්‍රමක්‍රමයෙන් අඩු වී ඇති ආකාරයක් පෙන්නුම් කරයි. 1985 වර්ෂයට සාපේක්ෂව 2012 වන විට වයස් වෙනසේ යම් වර්ධනයක් පැවතුනද විවාහ වන සාමාන්‍ය වයස් සීමාව අඩු වීම විශේෂත්වයකි. 1985 වර්ෂය වන විට කාන්තාවන් ගේ විවාහ වීමේ මධ්‍යයන වයස අඛණ්ඩව වැඩි වී ඇති ආකාරයක් උක්ත වගු සටහනට අනුව පෙනී යයි. මෙම වැඩි වීම කාන්තාවන් සඳහා සැලකිය යුතු වැඩි වීමක් වූවත් පුරුෂයන්ගේ විවාහ වීමේ මධ්‍යයන වයස ඉහළ ගොස් ඇත්තේ සුළු වශයෙනි. 1990 දශකයේ මැද භාගය පමණ වන තෙක් ජනතාව ඉහළ අධ්‍යාපන සුදුසුකම් අත් කරගැනීමට යොමු වීම සහ එකල තිබූ ඉහළ රැකියා වියුක්තිය හා ආර්ථික අපහසුතාවයන් නිසා විවාහය සඳහා ප්‍රමුඛ අවශ්‍යතා වන දෑවැදි සහ නිවාස සඳහා මුදල් සපයා ගැනීමට තිබූ ගැටළු සහගත බව යන කරුණු ශ්‍රී ලංකාවේ විවාහ ප්‍රමාද වීම හා සම්බන්ධයෙන් දායක වූ බව පෙන්නුම් කරයි. එසේ වුවත්, 1990 දශකයේ මුල් භාගයේ සිට ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන් හා පුරුෂයන් විවාහ වීමේ මධ්‍යයන වයස පහත වැටීමට පටන් ගෙන ඇති අතර 2012 වර්ෂය වන විට එය පුරුෂයන් සඳහා අවුරුදු 27.2 ක් ද ස්ත්‍රීන් සඳහා අවුරුදු 23.4 ක් ද විය. වර්ෂ 2006/2007 ප්‍රජා විද්‍යා හා සෞඛ්‍ය සමීක්ෂණයට අනුව ස්ත්‍රීන්ගේ විවාහ වීමේ මධ්‍යයන වයස අවුරුදු 23.5 ලෙස වාර්තා වූ අතර එය 1971 දී තිබූ අගයට සමාන වේ (ජන හා නිවාස සංගණනය,2012:28). මෙම සියවස ආරම්භයේ සිට විවාහ වීමට සුදුසු වයස් කාණ්ඩවල සිටි ස්ත්‍රී පුරුෂ ජන සංඛ්‍යාවන් වඩාත් සමබර පුම්තිරි අනුපාතයක් දක්වා වෙනස් වීම සහ පුරුෂයන් විශාල වශයෙන් විදේශ රැකියාවල නියුක්ත වීම නිසා පුරුෂ රැකියා වියුක්තිය පහළ යාම විවාහ වීමේ මධ්‍යයන වයස අඩු අගයකට ගෙන ඒමට දායක වූ ප්‍රධාන කරුණු ලෙස සඳහන් කළ හැකිය. තවදුරටත් කරුණු සොයා බලන විට ඉහළ වයස් කාණ්ඩවලට සාපේක්ෂව තරුණ වයස්වල සිටින ස්ත්‍රී සහ පුරුෂයින්ට රැකියා අවස්ථාවන් වැඩි වීම නිසා විශාල තරුණ පිරිසකට තම

විවාහය සඳහා අවශ්‍ය දෑවැදි සහ අනෙකුත් වියදම් සඳහා මුදල් තරුණ වයසේ දී ම රැස් කරගත හැකි වීම හා රැකියා සඳහා විදේශගත වූවන්ගෙන් ලැබෙන මුදල් මෙම විවාහ වීමේ මධ්‍යයන වයස අඩු අගයක් කරා ගෙන ඒමට මුල් වූ කරුණු ලෙස දැක්විය හැකිය. එසේම ඉහළ වයස්වල දී (අවුරුදු 35 හෝ ඊට වැඩි) සිදු වන විවාහ නිසා ඇති වන අතුරු විපාක පිළිබඳව දැනුවත්භාවය වැඩි වීම නිසාවෙන් ආකල්පවල සිදු වූ වෙනස සහ ගබ්සා කිරීමේ සේවා සපයන ස්ථාන වැසී යාමද ශ්‍රී ලංකාවේ විවාහ වීමේ මධ්‍යයන වයස අඩු වීමට දායක වූ කරුණු ලෙස සඳහන් කළ හැකිය (එම).

**දික්කසාද වූ/ කලත්‍රයාගෙන් වෙන් වූ පුද්ගලයන්**

2012 වර්ෂයේ ජන හා නිවාස සංගණනයට අනුව අවුරුදු 15 හා ඊට වැඩි දික්කසාද වූ පුරුෂයන් 14,847ක් ද, ස්ත්‍රීන් 26,328ක් ද වේ. කාන්තාවන්ගේ පහළ මර්ත්‍යතා මට්ටම මෙන්ම, දික්කසාද වූ කාන්තාවන් නැවත විවාහවීමට වඩා දික්කසාද වූ පුරුෂයන් නැවත විවාහවීම වඩාත් සුලබවීම මෙසේ දික්කසාද වූ පුරුෂයින්ට වඩා දික්කසාද වූ කාන්තාවන් වැඩි වීමට හේතු වී ඇතැයි සඳහන් කළ හැක. එමෙන්ම නීතියෙන් වෙන් වූ සහ වෙන් වූ (නීත්‍යානුකූලව නොවන) කණ්ඩායම් සඳහා ද මෙසේ ස්ත්‍රීන් සංඛ්‍යාව පුරුෂයන් සංඛ්‍යාවට වඩා ගණනින් අධිකවීම දැකිය හැක. වෙන් වූ පුද්ගලයන්ට නැවත විවාහවීමට නීතියෙන් ඉඩකඩ නොමැති බැවින් පිරිමින් නැවත විවාහවීම යන්න බලනොපාන බව පැහැදිළිය. වෙන් වූ (නීත්‍යානුකූලව නොවන) යන කාණ්ඩය යටතේ 1971 සහ 1981 වර්ෂවල පැවැත්වූ සංගණනවලදී තොරතුරු රැස්කර නොමැති අතර එම කාණ්ඩය යටතේ ප්‍රථම වරට සංගණනයක දී තොරතුරු රැස් කරනු ලැබුවේ 2001 වර්ෂයේදීය. මෙහිදී සංසන්දනය කිරීම සඳහා යොදා ගත් 1971 සහ 1981 වර්ෂවලදී ද මෙසේ දික්කසාද වූ/ ස්වාමි පුරුෂයාගෙන් වෙන්වූ කාන්තාවන් සංඛ්‍යාව දික්කසාද වූ/ භාර්යාවගෙන් වෙන්වූ පුරුෂයින් සංඛ්‍යාවට වඩා ගණනින් අධිකවීම දක්නට හැකි විය. දික්කසාද වූ/කලත්‍රයාගෙන් වෙන්වූ වයස අවුරුදු 15 හා ඊට වැඩි පුද්ගලයන් පහත වගුවෙන් දැක්වේ. 1971 සිට 1981 දක්වා කාලය තුළ දික්කසාද වූ පුද්ගලයන් ප්‍රතිශතය ඉතා ස්වල්ප වශයෙන් වැඩි වී ඇතත් 2012 වර්ෂය වන විට නැවත එය 1971 පැවැති මට්ටමට ආසන්න අගයක් ගනී. නමුත් නීතියෙන් වෙන් වූ පුද්ගලයන් ප්‍රතිශතය ක්‍රම ක්‍රමයෙන් අඩුවනු දැකිය හැකිය. 2012 ජන සංගණනයට අනුව සාමාන්‍යයෙන් පුරුෂයන් 10,000 ක් අතුරින් 58ක් සහ ස්ත්‍රීන් 10,000ක් අතුරින් 88 දෙනෙකු සිය විවාහක තත්ත්වය ලෙස කලත්‍රයාගෙන් නීත්‍යානුකූලව නොවුව ද වෙන්ව ජීවත්වන බව වාර්තා කර ඇත (ජන හා නිවාස සංගණනය,2012:76-77).

**වගුව 2. වයස අවුරුදු 15 හා ඊට වැඩි පුද්ගලයන් 10000ක් සඳහා දික්කසාද වූ/ කලත්‍රයාගෙන් වෙන් වූ පුද්ගලයන් ගණන, 1971, 1981 සහ 2012**

| සංගණන වර්ෂය | | දික්කසාද වූ | වෙන් වූ | |
|---|---|---|---|---|
| | | | නීත්‍යානුකූල | නීත්‍යානුකූල නොවන |
| 1971 | පුරුෂ | 22 | 21 | - |
| | ස්ත්‍රී | 32 | 31 | - |
| 1981 | පුරුෂ | 23 | 19 | - |
| | ස්ත්‍රී | 37 | 26 | - |
| 2012 | පුරුෂ | 20 | 15 | 59 |
| | ස්ත්‍රී | 33 | 25 | 88 |

මූලාශ්‍රය ඃ ජන හා නිවාස සංගණනය,2012ඃ77

උක්ත සටහනට අනුව 2012 වර්ෂය තුළ සිදු වූ දික්කසාදයන් තුළ නීත්‍යානුකූල තත්ත්වයට වඩා නීත්‍යානුකූල නොවන ආකාරයෙන් වෙන් වූ ප්‍රමාණය ඉහළ ගොස් ඇත. එය මානසික දික්කසාද ලෙස හැඳින්වුවද සාවද්‍ය නොවේ. විශේෂයෙන්ම අනියම් ලිංගික සබඳතා, ලිංගික අපචාර, මත්ද්‍රව්‍ය ඇබ්බැහිය, ගණිකා වෘත්තිය, ළමා අපචාර කෙරෙහි අතීතයට සාපේක්ෂව වත්මන් පුද්ගලයා යොමු වීමේ ප්‍රවනතාව ඒ සඳහා හේතු වී ඇත. විවාහ සංස්ථාව තුළ මෙකී සංකීර්ණ ගැටලු උද්ගත වීම

හේතුවෙන් පවුල් ඒකකය බිඳ වැටීමත්, කායික, මානසික හා අන්තර් සබඳතා පිරිහීමත්, ඒ හේතුවෙන්ම සමාජය තුළ බොහෝ අතුරු ප්‍රශ්න රාශියක් මතුවීමත් නොවැළැක්විය හැකිය. විවාහක කාන්තාවන් විදෙස්ගත වීමද විවාහ සංස්ථාව තුළ ගැටලු උත්පන්න වීමට තුඩු දී ඇති බැව් පැහැදිලිය. දිගුකාලීන බලාපොරොත්තු සහිතව විවාහයට යොමු වන පුද්ගලයන් කෙටි කාලයක් තුළ දික්කසාද වීම කෙරෙහි පවත්නා සමාජ ක්‍රමය මෙන්ම පුද්ගල ආකල්පයන්ද බලපානු ඇත. නූතන සමාජ ජාලා හා මාධ්‍ය මඟින් මේ කෙරෙහි දැඩි බලපෑමක් සිදු කර ඇති බව කාලීන තොරතුරු අනාවරණය කරයි.

**වැන්දඹුභාවය**

1971, 1981 සහ 2012 වර්ෂවල පැවති සංගණනවල දී සිය විවාහක තත්ත්වය 'වැන්දඹු' ලෙස ප්‍රකාශ කරන ලද වයස අවුරුදු 15 හා ඊට වැඩි පුරුෂයන් සහ ස්ත්‍රීන් ප්‍රතිශතයක් ලෙස පහත වගුවේ දැක්වේ.

**වගුව 3 : වයස අවුරුදු 15 සහ ඊට වැඩි වැන්දඹු ජනගහන ප්‍රතිශතයන්, 1971, 1981 සහ 2012**

| වයස් කාණ්ඩ | වැන්දඹු පුරුෂ | | | වැන්දඹු ස්ත්‍රී | | |
|---|---|---|---|---|---|---|
| | 1971 | 1981 | 2012 | 1971 | 1981 | 2012 |
| අවු.15 හා ඊට වැඩි සියලු වයස් කාණ්ඩ | 1.4 | 1.2 | 1.3 | 5.4 | 5.2 | 8.7 |
| 15-19 | 0.0 | 0.0 | 0.0 | 0.1 | 0.1 | 0.1 |
| 20-24 | 0.1 | 0.1 | 0.0 | 0.5 | 0.5 | 0.2 |
| 25-29 | 0.2 | 0.2 | 0.1 | 1.2 | 1.1 | 0.5 |
| 30-34 | 0.5 | 0.3 | 0.1 | 2.3 | 2.0 | 1.0 |
| 35-39 | 0.9 | 0.6 | 0.2 | 4.3 | 3.9 | 1.9 |
| 40-44 | 1.3 | 1.0 | 0.4 | 7.5 | 7.0 | 3.5 |
| 45-49 | 2.2 | 1.8 | 0.6 | 11.5 | 11.1 | 6.2 |
| 50-54 | 3.6 | 2.9 | 1.1 | 18.6 | 16.4 | 10.0 |
| 55-59 | 5.2 | 4.2 | 1.8 | 25.2 | 22.8 | 14.8 |
| 60-64 | 8.0 | 6.5 | 3.0 | 36.7 | 31.4 | 21.2 |
| අවු. 65 සහ ඊට වැඩි | 15.6 | 13.3 | 8.6 | 54.4 | 47.7 | 38.4 |

මූලාශ්‍රය ඃ ජන හා නිවාස සංගණනය,2012ඃ77

ඉහත වගු සටහනට අනුව පැහැදිලිව පෙනෙන කරුණක් වන්නේ 1971 සිට 2012 දක්වා සෑම වයස් කාණ්ඩයකම පුරුෂයින් සහ කාන්තාවන් සඳහා වැන්දඹුවීමේ ප්‍රවණතාව ක්‍රමයෙන් පහත වැටී ඇති බවයි. මර්ත්‍යතාව අඩුවීමේ වාසිය මෙමඟින් විද්‍යාමාන වන අතර අපේක්ෂිත අයුරින්ම වයස ක්‍රමයෙන් වැඩිවත්ම වැන්දඹුවීමේ ප්‍රවණතාව වැඩිවීම ද දක්නට ලැබේ. එමෙන්ම සෑම වයස් කාණ්ඩයක් සඳහා ම වැන්දඹු කාන්තාවන් සංඛ්‍යාව වැන්දඹු පුරුෂයන් සංඛ්‍යාවට වඩා වැඩිවීම ද විශේෂත්වයකි.

විශේෂයෙන් ම 35-59 වයස් කාණ්ඩයේ වැන්දඹු පුරුෂයන් සංඛ්‍යාවට වඩා වැන්දඹු ස්ත්‍රීන් ආසන්න වශයෙන් දස ගුණයක් පමණ වේ. බොහෝ විට මෙයට හේතු විය හැක්කේ 35-59 වැනි වයස් කාණ්ඩවල සිටින පිරිමින් වැන්දඹු වූ පසු නැවත විවාහ වීමේ ප්‍රවණතාව, වැන්දඹු කාන්තාවන් නැවත විවාහ වීමට වඩා වැඩි නිසා බැව් විය හැක.

**සහකරු තෝරාගැනීම - පිළියෙළ කළ/ජෝඩු කළ විවාහ (Arranged Marriage)**

බටහිරකරණයට දැඩිව නතු නොවූ ආසියාවේ සහ අප්‍රිකාවේ ඇතැම් කලාපවල විවාහයන් දෙමාපියන්ගේ මැදිහත්වීම මත සම්ප්‍රදායිකව පිළියෙල කරනු ලබයි (Lamanna & Riedmann,

2012:144). එහිදී මගුල් කපුවෙකුගේ (Matchmaker) මැදිහත්වීම ලබාගන්නා අතර මනාලිය පිළිබඳ අවසන් තීරණයක් ගැනීමට පෙර කේන්දර (Horoscope) විමසාබැලීමක් සිදු කරනු ලබයි. මෙවැනි විවාහයන් තුළ දී යුවලවල් (Couples) විසින් ස්වකීය විවාහය තුළ දී වයස, පෞරුෂය සහ සමාජ තත්ත්වය සළකා බැලීමක් සිදු කරන අතර බොහෝ යුවලවල් මංගල දිනය වන තෙක් එකිනෙකා මුණගැසී නැත (ibid). කෙසේ වුවද වර්තමානය වන විට මෙම විවාහ රටාව පැවතුන ද දෙමාපියන් විසින් හඳුන්වා දෙනු ලබන සහකරු හෝ සහකාරිය සඳහා දරුවන්ගේ කැමැත්ත තිබේනම් පමණක් විවාහය සිදු කරන අවස්ථා හඳුනාගත හැකිය. එහෙයින් මෙවැනි විවාහයන් ඇතැම් විට උපකෘත/ආධාර දුන් විවාහ (assisted marriages) ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය තුළ මුස්ලිම් හා වෙනත් සංක්‍රමණික ප්‍රජාව අතර හඳුනාගත හැකි බව සඳහන් වේ (Ingoldsby 2006; MacFarquhar 2006). ශ්‍රී ලංකාවේ 20 වන සියවසේ මුල් භාගය වන විට ඥාතීන් අතර සිදු වූ විවාහයන් සඳහා ඇති කැමැත්ත අඩු වූ අතර පිළියෙල කළ විවාහ කෙරෙහි පුද්ගල කැමැත්ත විතැන් විය. ආශා එල් අබේසේකර විසින් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයක් තුළින් පෙන්වා දෙන්නේ පිළියෙල කළ විවාහයන් තුළින් පුද්ගලයන් අපේක්ෂා කරන්නේ පවුලට බාහිර පාර්ශ්වයන් ඇතුළත් කරගැනීම තුළින් පවුලේ ප්‍රමාණාත්මක සංඛ්‍යාව වැඩි කර ගැනීම බවයි ''නෑයෝ එක්ක නෑදෑකම් හදලා වැඩක් නෑ; පවුල ලොකු කරගන්න තමයි බැලුවෙ'' (*"there was nothing to be gained from making relatives out of existing kin; the objective was to expand the family")* යන උපුටනයෙන් ඒ බැව් පැහැදිලි වේ. පශ්චාත් නිදහස් අවධිය තුළ අධ්‍යාපන හා රැකියා අවස්ථා උදෙසා ග්‍රාමීය අංශයෙන් කොළඹට සංක්‍රමණය වන මධ්‍යම පාන්තික පවුල් ඔවුන්ගේ ඥාතීන් සමඟ කිට්ටු සම්බන්ධතා පවත්වාගෙන ගියද නාගරික පරිසරයට අනුගත වීමේ අවශ්‍යතාව හා උනන්දුව මත වෙනත් නාගරික පවුල් සමඟ සම්බන්ධතා පවත්වන ලදී. එමෙන්ම නගරය තුළ විස්තාපනය වූ ඥාති සම්බන්ධතා ජාලයක් ඔවුන්ට නොමැති විය. එහෙත් ස්ථාපිතව තිබූ නාගරික මධ්‍යම පාන්තිකයන්ගේ විවාහ රටාව ඥාතීන් හා මිතුරන් අතර සිදු වූ අතර මේ වන විටද ඒ තත්ත්වය දැකගත හැකිය (Abeyasekara,2015). බොහෝ විට මෙවැනි විවාහ සිදු වීමේදී සැලකිල්ලට ලක් කරනු ලබන සාධක ලෙස කේන්දර නොගැලපීම, අසනීප තත්ත්වයන්ගෙන් පෙළීම, උසස් නම්බුවක් ඇති පවුල්වල සාමාජිකයන් වීම යනාදිය පදනම් වී ඇත (ජයතුංග,2005:75) එමෙන්ම විවාහ වීම් ප්‍රමාද වීම ද මීට හේතුවක් වී ඇතැයි හඳුනාගත හැකිය. කෙසේ වෙතත් දැවැද්ද යන සාධකයේදී මෙවැනි විවාහවල වැදගත්කමක් පවතින බැව් නූතනය තුළ පෙනී යයි.

**ප්‍රේම සබඳතා මත විවාහ සිදුවීම**

සම්ප්‍රදායික පවුල් ව්‍යූහයේ පුද්ගලයාගේ විවාහය වූ කලී එක් ස්ත්‍රියක් හා එක් පුරුෂයෙක් එකතු කළ ක්‍රියාවක් නොවේ. එය එක් සමූහයක් සහ තවත් සමූහයක් මුණගැස්වීමේ ක්‍රියාවලියකි. නමුත් නූතන සමාජය තුළ විවාහය ද පුද්ගල දිශානතියකට යොමු වී තිබේ. තරුණ පරපුර සහකාරිය හෝ සහකරු තමා ම තෝරාගත යුතු බවට විශ්වාසයක් තිබේ. මෙයින් පැහැදිලි වන්නේ විවාහයේදී ස්වකීය අභිමතය පෙරට පැමිණ තිබෙන බවයි. මේ නිසා දෙමාපියන් සහ ඥාති සමූහයේ බලපෑම එතරම් වැදගත් නොවේ. ප්‍රේම සබඳතා මත විවාහයට ඇතුලත්වන්නන්ගේ අභිලාෂය වී ඇත්තේ අන්‍යොන්‍ය වශයෙන් දිගුකලක් හැඳිනගෙන, දිගුකලක් ආශ්‍රය කිරීම තුළින් වඩාත් යහපත් විවාහ ජීවිතයක් ගත කළ හැකි බවයි. පිළියෙල කරන ලද හා යෝජිත විවාහයන්හිදී මෙන් මෙවැනි විවාහයන්හිදී කුලය, පන්තිය, අධ්‍යාපන තත්ත්වය, ප්‍රදේශය හා පරම්පරාව යන සාදක කෙරෙහි සැලකිල්ලක් නොදක්වන්නේ යැයි සමාජීය පිළිගැනීමක් පැවතුනද කුලය හා පන්තිය යන සාධක කෙරෙහි සැලකිල්ලක් දක්වන බව පෙනී යයි (ජයතුංග,2005:73).

**මඟුල් කපුවා ගේ සම්ප්‍රදායික මැදිහත්වීම වෙනුවට සේවා සපයන ස්ථාන බිහිවීම**

යෝජිත විවාහයන්හි දී සුවිශේෂී කාර්යභාරයක් ඉටුකරන මඟුල් කපුවාගේ භූමිකාව විවාහ මංගල්‍යයකදී වැදගත්වන්නේ මනාල, මනමාල දෙපාර්ශ්වයම එක් අදහස් සමූහයක් කරා ගෙන ඒමේ කාර්යය මනාව ඉටු කරන හෙයිනි. සරිලන සහකරුවන් තේරීමේදී කේන්දරවල ගැලපීම, කුලය,

පන්තිය, පරම්පරාවල යෝග්‍යතාව හා සහකරු හා සහකාරිය මුණගස්වා ඔවුනොවුන් හඳුනාගැනීමට සැළැස්වීම වැනි බොහෝ කාර්යයන් ප්‍රමාණයක් මොහුගෙන් සිදුවන්නකි.

නමුත් වර්තමානය වන විට මෙම තත්වයේ භූමිකාවේ ස්වරූපය වෙනස් වී ඇති ආකාරයක් පෙනී යයි. සම්ප්‍රදායික මගුල් කපුවෙකු වෙනුවට අන්තර්ජාලය භාවිතයෙන් සහකරුවන් තෝරා දෙනු ලබන පුද්ගලයන් ද, ආයතන ද වත්මන්හි බිහි වී ඇත. සම්ප්‍රදායික ක්‍රමයට වඩා විශාල මුදලක් ද ඒ වෙනුවෙන් සැපයීමට සිදු වන අවස්ථාද වේ. මීට අමතරව අන්තර්ජාලය තුළ වෙබ් අඩවි මගින් සහකරුවන්/සහකාරියන් තෝරාගැනීමේ ඉඩප්‍රස්ථා සැළසී ඇත. උදාහරණ ලෙස marriage.lk, http://www.exceldatabank.com, www.bridegroommatch.com, www.srilankanmatrimony.com www.letmedate.com, www.mypartner.lk, http://www.partner.lk, www.liyathabara.com, http://www.saranamangala.com, http://www.srilankaproposals.com යන වෙබ් අඩවි ඉන් කිහිපයකි.

**පූර්ව ලිංගික සබඳතා (Premarital Sex Relations) වැඩිවීම හා එකට ජීවත් වීම (Living together)**

නව යොවුන් විය හා විවාහප්‍රාප්ත වී අතර කාලය පූර්ව වෛවාහික අවධිය ලෙස සැලකේ. ශාරීරිකව, මානසිකව හා සමාජීය වශයෙන් නව යොවුන් වියට පත්වන වයස ක්‍රමයෙන් පහළ වැටීම ද, අනෙක් අතට විවාහ වන වයස ඉහළ යාම ද පූර්ව වෛවාහක අවධිය දීර්ඝ වීම කෙරෙහි බලපා ඇත. මේ විශ්වීය ප්‍රවනතාවයට අනුවර්තනය වීමේදී බොහෝ සමාජවල පූර්ව වෛවාහක ලිංගික සබඳතා කෙරෙහි ඇති සමාජ තහංචිවල ළිහිල් වීමක් හා එවැනි සබඳතා සඳහා ඇති සමාජ අවස්ථා ප්‍රසාරණය වීමක් ද සිදු වී ඇත. මෙම සබඳතාව සමඟ එකට ගමන් කරන තවත් ප්‍රවනතාවක් ලෙස විවාහයට පෙර සහකරු සහ සහකාරිය ගෘහීය වශයෙන් එකට ජීවත් වීම සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතින බැව් පෙනී යයි.

**වෙනස්වීමේ වෙනත් සාධක**

මීට අමතරව විවාහ උත්සව සහ නවීන අංගයන්ගේ වෙනස්වීම, විශේෂයෙන්ම මංගල්‍ය කටයුතු සුඛෝපභෝගී හෝටල් තුළ සිදුකිරීම, විවාහය සැළසුම් කිරීම (Event Manager) සඳහා පුද්ගල හා ආයතනවල උපදේශකවරුන් යොදාගැනීම, විවාහය පැවැත්වීමට පෙර සහකරු හා සහකාරිය අතර මංගල්‍යයේ පූර්ව පුහුණුවීම් සිදුකිරීම, මංගල්‍යය සඳහා ආරාධනය කිරීමේ ක්‍රමවේද වෙනස්වීම, සහකරු හා සහකාරියගේ ඡායාරූප විවාහයට පෙර ගැනීම, සම්ප්‍රදායික ඇඳුම් පැළඳුම් බටහිරකරණය වීම, සංගීත කණ්ඩායම් සහභාගී වීම, විවාහ නවක වදය ක්‍රියාත්මක වීම හා දෑවැද්දෙහි අවශ්‍යතාවය අඩු වීම ආදිය දැකගත හැකිය. විශේෂයෙන්ම විවාහයක් තුළින් බලාපොරොත්තු වන මූලික පරමාර්ථයක් වන දරුවන් සෑදීම වර්තමානය වන විට ඉතා සීඝ්‍රයෙන් අඩු වන තත්ත්වයක් හඳුනාගත හැකිය. එහිදී පවුලේ දරුවන් සංඛ්‍යාව එක් ළමයෙක්ට හෝ දෙදෙනෙක්ට සීමා වීම හඳුනාගත හැකිය. මෙය පසුකාලීනව පවුල් තුළ ඒකාබද්ධතාවය බිඳවැටීමට තුඩු දෙන්නේ පවුලේ වැඩිහිටි සාමාජිකයන් රැකබලාගැනීමේ අපහසුතාවයන් සෙසු සාමාජිකයන්ට උද්ගත වන නිසාවෙනි.

**සමාලෝචනය**

ආරම්භයේදී සඳහන් කළාක් මෙන් විවාහ සංස්ථාව තුළට බොහෝ නව ප්‍රවනතාවන් හෙවත් නවාංග එකතු වීම හේතුවෙන් විවාහ සංස්ථාව කාලානුරූපීව විවිධ වෙනස්කම්වලට තුඩු දී ඇත. සමාජ ව්‍යූහය සහ සමාජ සංවිධානය පිළිබඳ සංයුක්ත විග්‍රහයකදී සමාජ සංස්ථාව තුළ හැඩගැසෙන නව ප්‍රවනතා පිළිබඳ ව විශේෂ අවධානයක් යොමු විය යුතුය. සමාජ ව්‍යූහය මගින් යම් සමාජයක පවතින කල්පවත්නා සබඳතා පිළිබඳවත්, සමාජ සංවිධානය මගින් කාලීන වශයෙන් සමාජ ව්‍යූහය තුළ ඇති වන කෙටිකාලීන හා දිගුකාලීන වෙනස්කම් පිළිබඳවත් සාකච්ඡා කළ හැකිය. ඒ අනුව විවාහ සංස්ථාව තුළ සිදුවෙමින් පවත්නා වෙනස්කම් අධ්‍යයනය කළ යුත්තේ අනෙකුත් සංස්ථාවන් තුළ සිදුවන වෙනස්කම්වලට සමගාමී ආකාරයකටයි. පවුල පිළිබඳ සමාජ සංස්ථාව මෙසේ පැවතිය

යුතු යැයි ප්‍රතිමානක මට්ටමක තීරණය වී තිබුණත් තත්‍ය (actual) මට්ටමකදී ප්‍රතිමානක මට්ටමක වඩා වෙනස්වන හෝ අපගමනය වන අවස්ථා කොතෙකුත් විද්‍යමාන වේ. මෙය සමාජ, ආර්ථික, දේශපාලනික සහ සංස්කෘතික වශයෙන් සමාජ උප පද්ධතීන් ආශ්‍රිතව සාර්ව මට්ටමකින් විශ්ලේෂණය කළ හැකි අතරම පවුල, ආර්ථිකය, ආගම, අධ්‍යාපනය, දේශපාලනය සහ නීතිය යන අංශ ද සංස්ථාගත ආකාරයට ද විග්‍රහ කළ හැකිය. අනෙක් අතට එක් එක් සමාජ ඒකකවල පුද්ගල භූමිකාවන් ආශ්‍රය කොටගෙන සූක්ෂම මට්ටමේ විග්‍රහයක් ඉදිරිපත් කළ හැකිය. එනම් අඹු සැමි සබඳතා, දූ දරු සබඳතා, ඥාති හිත මිත්‍ර සබඳතා ආදී වශයෙනි. අවසන් වශයෙන් සඳහන් කළ හැකි වන්නේ විශ්ව ව්‍යාප්ත සන්නිවේදන ජාලයක් හරහා ගෝලීයකරණයට භාජනය වෙමින් පවතින ශ්‍රී ලංකාව වැනි සංස්කෘතික සන්දර්භයක සම්ප්‍රදාය සහ නවීකරණය අතර ගැටුමක් ඇති වීම නොවැළැක්විය හැකි කරුණක් මෙන්ම සංස්කෘතියේ අංගෝපාංගවල වෙනස්වීම ද අනිවාර්ය කරුණක් බවයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ආරියපාල, ඇම් බී. 1962. *මධ්‍යකාලීන ලංකා සමාජය.* රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු ප්‍රකාශණය.

එල්ලාවල මේධානන්ද හිමි .2003. *පාචීනපස්ස උත්තරපස්ස, නැගෙනහිර පළාත් හා උතුරු පළාතේ සිංහල බෞද්ධ උරුමය.* කොළඹ: දයාවංශ ජයකොඩි ප්‍රකාශන.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව. 2012. *ජන හා නිවාස සංගණනය:* බත්තරමුල්ල.

ජයතුංග, නදීරා. 2005[a]. *විවාහය පිළිබඳ සමාජ විද්‍යාත්මක විමසුමක්.* ජා ඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ.

ජයතුංග, නදීරා. 2013[b]. *සමාජීය විද්‍යා ලිපි.* කඩවත: නුවණී ප්‍රකාශන.

බද්දේගම විමලවංස හිමි. 1996. *හෙළ හැදියාව.* කොළඹ: සමයවර්ධන ප්‍රකාශන.

පීරිස්, රැල්ෆ්. 2016. *සිංහල සමාජ සංවිධානය.* බොරලැස්ගමුව: විසිදුනු ප්‍රකාශන.

පොල්වත්තේ බුද්ධදත්ත හිමි(සංස්) . 1959. *මහාවංසො.* කොළඹ: එම්. ඩී. ගුණසේන ප්‍රකාශන.

මුණසිංහ, ඉන්ද්‍රාණි. 1998. *පැරණි ලක්දිව කාන්තාව.* කර්තෘ ප්‍රකාශන.

ලියනේගම චන්දසිරි හිමි, 2006. *හෙළ සිරිතයි - විවාහයයි.* ගම්පහ: දීපණ මුද්‍රණාලය.

සේනාරත්න, පී ඇම්. 2001. *ශ්‍රී ලංකාවේ සංස්කෘතික දායාද.* කොළඹ: එස්. ගොඩගේ ප්‍රකාශන.

ශ්‍රී අලවත්තගේ, ප්‍රේමදාස. 2007. *පැරණි සිංහල විවාහ සංස්කෘතිය.* කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

හේරත්, එච්. එම්. ඩී ආර්. 1999. *ඥාතීත්වය.* කර්තෘ ප්‍රකාශන.

Abeyasekara, Asha L., 2015. *From ‘Arranged’ to ‘Choice’. Changing Marriage Practices in Contemporary Sri Lanka. Rethinking Kinship and Marriage in Sri Lanka: Gender, Intimacy, and Change Workshop,* (September). 1–37. Retrieved January 19 2019 (www.academia.edu).

Caldwell, Bruce. 1992. *Marriage in Sri Lanka: A Century of Change*. Unpublished Thesis for Doctor of Philosophy of the Australian National University.

Cheater, Angela. 1995. *Social Anthropology: An Introduction*. New York: Routledge and Kegan Paul.

Davis, K. 1948. *Human society*. New York: MacMillan Publishing House.

Edvard, Westermarck. 1926. *A short History of Human Marriage*. London: Macmillan.

Fortunato, L. 2015. *Evolution of marriage systems. In Wright, J. D. (Ed.), International Encyclopedia of the Social & Behavioral Sciences*. 2nd ed., vol. 14, pp. 611-619. Oxford: Elsevier. doi.org/10.1016/B978-0-08-097086-8.81059-4.

Henrich, J., Boyd, R., & Richerson, P J. 2012. *The puzzle of monogamous marriage. Philosophical transactions of the Royal Society of London*. Series B, Biological sciences, 367(1589), 657-69.

Ingoldsby, Bron B. 2006. "*Mate Selection and Marriage".* Pp.133-46 in Families in Global and Multicultural perspective, 2nd ed., edited by Bron B. Ingoldsby and Suzanna D. Smith. New York: Guilford

Karunanayake, Nandana. 2000. *Changing Patterns of Marriage in Sri Lanka*. Nugegoda: The Institute for Professional Development.

MacFarquhar, Neil. 2006. "*It's Muslim Boy Meets Girl, but Don't Call It Dating."* New York Times, September 19. Retrieved January 19 2019 (www.nytimes.com)

Mendis, G C. 1940. *Early History of Ceylon*. Calcutta: Y.M.C.A Publishing House

https://www.britannica.com/topic/same-sex-marriage/ Retrieved 2/7/2019